01) පාඩම හෝ ඒකකය - 7.2.4. දඹුලු ගලේ රූ වරුණා

02) ඉගෙනුම් ඵල -

- දඹුලු විහාරයේ චිත්‍ර සඳහා පාදක වූ වස්තු විෂයයන් හා සිතුවම් නම් කරයි.
- දඹුලු විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලයි.
- චිත්‍ර නිර්මාණ සඳහා පදනම් වූ ශෛලිය හා ශිල්ප ක්‍රම විස්තර කරයි.
- දඹුලු විහාරයේ චිත්‍රවල කලා ලක්ෂණ අගයමින් විස්තර කරයි.

03) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- දඹුලු විහාරයේ ගෘහ නිර්මාණ, බිතු සිතුවම් හා මූර්ති පිළිබඳව අවධාන යොමු කරන්න.
- එම කලා නිර්මාණවල ආභාසය, ශෛලිය, වස්තු විෂය පිළිබඳ ව අවබෝධයක් ලබා ගන්න.
- දඹුලු විහාරයේ නිර්මාණවල ඓතිහාසික පසුබිම සොයා බලා එම සිතුවම්වල වස්තු විෂයයන් හා විශිෂ්ට සිතුවම් නම් කරන්න
- දඹුලු විහාරයේ නිර්මාණවලට අදාළ වැඩිදුර තොරතුරු එක්රැස් කරන්න.
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකාව**

01) දඹුලු විහාරයේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පැහැදිලි කරන්න.

- යුගය/ කාලය
- අනුග්‍රහය
- ශිල්පියා

02) දඹුලු විහාර සිතුවම් අතර දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ ඇගයීමක් කරන්න.

- ශෛලිය
- ශිල්ප ක්‍රමය
- වර්ණ භාවිතය
- රේඛාකරණය
- තලය භාවිතය
- භාව ප්‍රකාශන

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=0ujb3wdIi9w
  https://www.youtube.com/watch?v=wvm4bw1C0Mw
  https://www.youtube.com/watch?v=bQb6F3gDlMw
  https://www.youtube.com/watch?v=77Xjju5efsg
  https://www.youtube.com/watch?v=74JK0sNRxDg
  https://www.youtube.com/watch?v=cpqfjxOtq7Q
  https://www.youtube.com/watch?v=TZZ1Zf_2STY
- කියවීම් පත්‍රිකාව -

- ක්‍රි.ව. 1 වන සියවසේ දී පමණ වලගම්බා රජු විසින් (වට්ටගාමිණි අභය) කරවා ඇති මෙහි දේව රාජ ලෙන මහා රාජ ලෙන මහා අලුත් විහාරය පශ්චිම විහාරය දෙවන අලුත් විහාරය වශයෙන් ලෙන් 05කින් සමන්විතය.
- මහා රාජ ලෙන යනුවෙන් නම් කර ඇති ලෙනේ සැතපෙන බුද්ධ ප්‍රතිමා ඇතුළු බෝධිසත්ව හා රජවරුන්ගේ ප්‍රතිමා රැසක් දැකිය හැකි ය.
- දඹුලු විහාර සිතුවම් මහනුවර යුගයට අයත් වන අතර අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන සිතුවම් කොටසක් ද දැකගත හැකි ය.
- දඹුලු විහාරයේ බිතු සිතුවම් ඇඳීමේ ගෞරවය හිමිවන්නේ නීලගම සිත්තර පරම්පරාවට ය.
- මහනුවර යුගයට අයත් දඹුලු සිතුවම් පහත ලෙස වර්ග කළ හැකි වේ.
  - බෝධිසත්ව චරිත අවස්ථා - සූවිසි විවරණය/ ජාතක කතා
  - බුද්ධ චරිතයේ විවිධ අවස්ථා - මාරපරාජය/ රන්කාසි අතුරා ජේතවනය පුජා කිරීම
  - ඓතිහාසික සිදුවීම් - විජයාගමන/ මහින්දාගමනය/ ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම/ එළාර දුටුගැමුණු යුද්ධය

05) අතිරේක පොත්/සඟරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- පූජිත සිත්තරු - සොලමන් ප්‍රේමානන්ද


**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**